කඩුගන්නාව නගර සභාව

මහනුවර දිස්ත්‍රික්කය

-------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව නොපැවති රු.83,500 ක් වටිනාකම වූ කොම්පෝස්ට් බැරල් 5 ක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) අංක 159 - 60 - 01 -00002225 - 01 දරන ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබිය යුතු රු.38,956 ක පොළිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) අංක 2 - 0084 - 11 - 01234 දරන ස්ථාවර තැන්පතුවට අදාළ වාර්ෂික පොළිය රු.81,562 ක් වුවද, ගිණුමේ එම වටිනාකම රු.108,602 ක් ලෙස දැක්වීම නිසා වර්ෂයේ ආදායම් රු.27,040 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) අංක 2 - 0084 - 11 - 01234 දරන ස්ථාවර තැන්පතුවේ වටිනාකම රු.1,348,588 ක් වුවද, එය රු.1,402,544 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු.53,956 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් 4 ක් වෙනුවෙන් ගෙවිය යුතු හා ලැබිය යුතු රු.52,935 ක අතරැඳි මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

බලපත්‍ර ගාස්තු නොගෙවීම, වෙළඳ සංකීර්ණ හා සතිපොළ බදුදීම හා අනවසර ඉදිකිරීම් සම්බන්ධව නඩු 13 ක් සභාව විසින් පවරා ඇතත්, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට අනුව පොදු ගබඩා තොගයේ වටිනාකමරු.756,105 ක් වුවද, උපයෝගී ලේඛන අනුව රු.591,975 ක් වූයෙන් රු.164,130ක වෙනසක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 වටිනාකම රු.4,738,945 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයක වටිනාකම රු.252,826 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.4,356,031 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.4,042,227 ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.6,396,470 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සතොක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | අංක එන්පී/ආර්ටීසී/ටීආර්/සීඑම්/12/07 හා 2012 සැප්තැම්බර් ත්‍රීරෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා වැඩපිළිවෙලක් හඳුන්වා දීම නැමැති අමාත්‍ය මණ්ඩල සංදේශය | ලියාපදිංචි ත්‍රීරෝද රථ 400 කින් රු.481,200ක ගාස්තු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1980 දෙසැම්බර් 31 දිනැති හා අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය | වසර 5 කට වරක් තක්සේරුගත කුලිය සංශෝධනය කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,851,137 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,274,116 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.422,979 ක පහත වැටීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.422,979 ක පහත වැටීමට වරෙන්තු ගාස්තු දඩ ආදායම් විෂයයේ රු.491,729 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය පිළිවෙලින් 1.8:1, 2.4:1 සහ 1.6:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 වරිපනම් හා බදු

(අ) 2016 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ආදායම රු.5,244,665 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දක්වා බිල්කල ආදායම රු.7,569,773 ක් විය. ඉකුත් වර්ෂයේ හිඟයෙන් රු.2,196,320 ක් හා බිල්කළ ආදායමෙන් රු.4,852,708 ක් අයකර ගෙන තිබූ අතර, ප්‍රතිශතයක් ලෙස එය පිළිවෙලින් සියයට 64 ක් හා සියයට 41 ක් විය. ඒ අනුව ආදායම් රැස් කිරීම් දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) හිඟ වරිපනම් විශ්ලේෂණය කර බැලීමේදී රජයේ ආයතන වලින් අයවිය යුතු රු.690,252 ක් වූ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි.

2.4.2 බදුකුලී
--------

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.237,051 ක් වූ හිඟ කඩකුලී ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල්කල ආදායම රු.1,651,752 ක් විය. ඉකුත් වර්ෂයේ හිඟයෙන් රු.62,050 ක් හා බිල්කල ආදායමෙන් රු.1,563,636 ක් පමණක් අයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.252,826 ක හිඟ පොළ බදු ශේෂය අයකරගෙන නොතිබුණි.

2.4.3 වෙනත් ආදායම්
------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.243,750 ක හිඟ තානායම් ගාස්තු අයකරගෙන නොතිබුණි.

2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.218,015 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.578,950 ක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්යසාධනය
------------------

නාගරික පරිසරය තුළ ජීවත්වන ජනතාවගේ පොදු පහසුකම් ඉහළ නැංවීම නගර සභාවකින් ඉටුවිය යුතු කාර්යයක් වුවද, වෙළඳ සංකීර්ණය අසල හා නගරයේ කාණු පද්ධති පිරිසිදු කිරීම හා නගරය පිරිසිදුව තබා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාව සතු ඉඩම් බදු දීමේදී ගිවිසුමකින් තොරව බදු දී තිබුණු අතර, ස්ථිර ඉදිකිරීම්ද සිදුකර තිබුණි.

(ආ) කඩුගන්නාව නගර සභාවට අයත් පැරණි කාර්යාල ගොඩනැගිල්ල සහිත දුම්රිය රක්ෂිත ඉඩම බදුකර අංක එල්සී 32699 මගින් වර්ෂයකට රු.275,000 ක බදු මුදලක් මත බැඳුම්කරයට එළඹ තිබුණි. බදු ගෙවීම 2014 දෙසැම්බර් දක්වා අක්‍රමවත්ව සිදුකර තිබූ නිසා එදිනට හිඟය රු.3,411,201 ක් වී තිබුණි.

(ඇ) සභාව සතු වර්ග අඩි 1738 කින් යුක්ත සම්මන්ත්‍රණ ශාලා ගොඩනැගිල්ල කුලියට දීමෙන් 2016 වර්ෂයේදී උපයා තිබුණේ රු.35,000 ක ආදායමක් පමණි.

(ඇ) සභාව සතු නිවාස අබලන් තත්ත්වයෙන් පවතින අතර, අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාවේ කලාදුරුකොටුව හා මැංගුස්වත්ත ඉඩම්වල මායිම් හඳුනාගෙන ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ 2015 පෙබරවාරි 27 දින ලබාදුන් රු.455,579 ක් වටිනා පරිගණක හා උපාංග යෝජිත අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා යොදවා නොගෙන කාර්යාලයේ තබා තිබුණි.

(ආ) සභාව විසින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගොඩනැගිලි සැලසුම් 337 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 13 කට පමණි.

3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.598,000 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 6 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2015 පෙබරවාරි මස පරිත්‍යාග වශයෙන් සභාව වෙත ලැබී තිබුණු පිළිවෙලින් රු.17,649,179 ක් හා රු.7,967,144 ක් වටිනා බැකෝ යන්ත්‍රය හා වයිබ්‍රේටින් රෝල ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) සභාව සතු පැරණි කාර්යාලය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

ළමා උද්‍යානය සංවර්ධනය කිරීම

---------------------------------------

2016 වර්ෂයේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ කඩුගන්නාව සුනිල් එස්. අබේසුන්දර ක්‍රීඩා පිටියේ ළමා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා රු.641,622 ක මුදලක් ගෙවීම් කර තිබුණි. වැඩ විෂයය අංක 2 ප්‍රකාරව ක්‍රීඩා උපකරණ සවි කිරීමට සකස් කල පාදම සැකසීමට රු.63,088 ක් ගෙවා ඇතත්, පාදම සමමිතිකව හා නිසි ප්‍රමාණයට සිදුකර නොතිබුණි. මිලදී ගෙන තිබුණු කාපට් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සර්කියුලර් ග්ලොබ් උපකරණය සඳහා කොන්ක්‍රීට් පාදම සකසා තිබුණද, කාපට් ඇතිරීම සිදුකර නොතිබුණු අතර, කාපට් 27 ක් ක්‍රීඩා මණ්ඩපය තුළ තිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 2 ක පමණ ඝන අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා එකතු කරන නමුත් කසල වෙන්කර ලබා ගැනීමක් සිදු නොකරන අතර, දිරාපත්වන කසල මෙට්‍රික් ටොන් 1 ක පමණ ප්‍රමාණයක් රු.1,000 බැගින් ගෙවා යටිනුවර ප්‍රාදේශීය සභාවේ කසළ අංගනයට භාරදෙමින් පැවතුණි. ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි දිරාපත් නොවන කසළ නගර සභාවට ඉඩමක් නොමැති බැවින් විවෘත භූමියේ බැහැර කිරීම නිසා ඉන් පරිසරයට හානි සිදුව තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 11 ක් සඳහා සලසා දී තිබුණු රු.1,920,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 25 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 42 සිට සියයට 1520 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 25 ක ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම් අතර සියයට 29 සිට සියයට 18643 අතර පරාසයක විචලනයක් පවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය
------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ

(ඊ) කොන්ත්‍රාත් පාලනය